# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2152/64 - 2019 දෙසැම්බර් මස 06 වැනි සිකුරාදා - 2019.12.06**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

### ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන නිවේදනයයි

1988 අංක 30 දරන (සංශෝධිත) බැංකු පනතේ 76(ඊ)(1) වගන්තිය සමග කියවිය යුතු 9(8)(අ)/(ආ) වගන්ති යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් කරනු ලබන නිවේදනයකි.

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි,
මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

2019 ක් වූ දෙසැම්බර් මස 06 දින,
කොළඹ දී ය.

ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් වෙත නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීම

2016 රජයේ අයවැය මගින් යෝජනා කරන ලද පරිදි ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමග ඒකාබද්ධ කිරීමෙන් අනතුරුව 1988 අංක 30 දරන (සංශෝධිත) බැංකු පනතේ 76(ඊ) වගන්තිය සමග කියවිය යුතු 9(9) වගන්තියේ නියෝග ප්‍රකාරව, ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් වෙත නිකුත් කර ඇති බලපත්‍රය 2019 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි අහෝසි කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව, 2019 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් හි සියළුම වත්කම් හා වගකීම් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් අත්පත් කරගෙන ඒකාබද්ධ කරන ලද අතර, ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් විසින් පවත්වාගෙන යන ලද සියළු බැංකු ව්‍යාපාර කටයුතු ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් සිදුකෙරෙනු ඇත.

ඒ අනුව, 1988 අංක 30 දරන (සංශෝධිත) බැංකු පනතේ 76(ඇ) වගන්තිය ප්‍රකාරව IV වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් වෙත ලබා දී තිබූ බලපත්‍රය 2019 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර ඇත.

12 - 773


1A - G 31629 — 37 (2019/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*